(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(2).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2018 නොවැම්බර් 27 වැනි අඟහරුවාදා**

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 3/'18

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරි පියවර ගතයුතු බව,— 2018 ඔක්තෝබර් 26 වැනි දින ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍යවරයා ලෙස පත්කළ හෙයින් ද;

2018 නොවැම්බර් 14 වැනි දින සම්මත වූ යෝජනාවේ පළමුවැනි ඡේදය ඉවත් කර 2018 නොවැම්බර් 16 වැනි දින ගරු මහින්ද රාජපක්ෂ මහතා සහ ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී එම යෝජනාව සම්මත වූ හෙයින් ද;

ඒ අනුව 2018 නොවැම්බර් 14 වැනි දින සම්මත වූ යෝජනාවේ පළමුවැනි ඡේදය ඉවත් කර ඇති හෙයින් ද;

2018 නොවැම්බර් 16 වැනි දින සම්මත වූ යෝජනාව හරයාත්මකව ගරු මහින්ද රාජපක්ෂ මහතා සහ ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් වන හෙයින් ද; සහ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති හෙයින් ද;

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ගතයුතු ඉදිරි පියවර ගන්නා ලෙස මෙම පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාට යෝජනාකර සිටියි.

---